**පාලම් 25 ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2016**

---------------------------------------------------------------------------

පාලම් 25 ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල (අ.ආ.සං.කු.අ.) අතර 2014 ජනවාරි 30 දින එළඹි අංක 886 දරන ණය ගිවිසුමේ ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය මාර්ග සංවර්ධන අධිකාරිය වේ. ඉහළ යමින් පවතින මගී හා භාණ්ඩ ප්‍රවාහන ඉල්ලුම සපුරාලීම සඳහා සහ මෝටර් රථ මෙහෙයුම් හා මාර්ග නඩත්තු පිරිවැය, ප්‍රවාහන කාලය හා අනතුරු අඩුකර ගනිමින් බස්නාහිර, සබරගමුව, නැගෙනහිර, දකුණ, වයඹ, මධ්‍යම, උතුර යන පළාත්වල ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා, පදිකයන් සඳහා මංතීරු දෙකක් සහිතව පාලම් 25 ක් නැවත ඉදිකිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය කුවේට් ඩිනාර් මිලියන 10 කට සමාන රු.මිලියන 4,632 කි. අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල සම්පූර්ණ පිරිවැය මූල්‍යායනය කිරීමට එකඟ විය. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 ජනවාරි 30 ආරම්භ කළ අතර 2018 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දැ

තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් ව්‍යාපෘතිය විසින් දරන ලද වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනා ගෙන තිබුණේද යන බව.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**---------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්‍ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව අදහස් දැක්වීම්**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ව්‍යාපෘතියේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නියමිත පරිදි සකස් කර නොතිබුණි. මෙම නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ආයෝජන හා මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණු මුදල් පිටතට ගලායාමේ රු.මිලියන 73 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණු මුදල් ගලා ඒමේ ප්‍රවාහයන් රු.මිලියන 75.58 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ව්‍යාපෘතිය මඟින් පාලම් 8 ක පිරිවැය වෙනම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු නොකර පාලම්වල මුළු පිරිවැය වූ රු.මිලියන 241.63 ක මුදල කෙරීගෙන යන වැඩ ලෙස 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ හා 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දිනට | |
| | කුවේට් ඩිනාර් | රු.මිලියන | රු.මිලියන | කුවේට් ඩිනාර් | රු.මිලියන | කුවේට් ඩිනාර් | රු.මිලියන |
| අ.ආ.සං.කු.අ. | 10 | 4,632 | 625 | 0.45 | 218.76 | 0.57 | 277.99 |
| ශ්‍රී.ලං.ජ. | - | - | 45 | 0.02 | 11.10 | 0.05 | 24.75 |
| එකතුව | 10 | 4,632 | 670 | 0.47 | 229.86 | 0.62 | 302.74 |

## 3.2 භෞතික කාර්යසාධනය

---------------------------

ව්‍යාපෘතියේ ලියවිලිවලට අනුව, පාලම් 25 ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත් පැකේජ් 03 ක් යටතේ ප්‍රදානය කිරීමට සැලසුම් කර තිබුණු අතර එම කොන්ත්‍රාත් අතරින් පාලම් 8 ක් පැකේජ් - 01 යටතේ රු.මිලියන 987 ක පිරිවැයකට විදේශීය සහයෝගීතාවක් සහිත දේශීය සමාගමකට 2015 සැප්තැම්බර් 07 දින පිරිනමා තිබුණි. එසේවුවත්, අංක 1/1 කඩුවෙල-බියගම මාර්ගයේ පිහිටි පාලමේ ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත්කරුගේ දුර්වලතා හේතුවෙන් අත්හැර දමා තිබුණු අතර අංක 2/2 හා 2/3 තංගල්ල-වීරකැටිය මාර්ගයේ ඇති පාලම්වල ඉදිකිරීම් කටයුතු සැලසුම් වෙනස් කිරීම හේතුවෙන් ආරම්භ කර නොතිබුණි. අනෙකුත් පාලම් ඉදිකිරීමේ භෞතික කාර්යසාධනය සියයට 35 කට අඩු මට්ටමක විය. ඉතිරි පැකේජ 02 යටතේ වන කොන්ත්‍රාත් 2016 දෙසැම්බර් 31 දින දක්වාම ප්‍රදානය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 ජනවාරි 13 දින විදේශීය උපදේශකයන් සමඟ අත්සන් කරන ලද උපදේශන කොන්ත්‍රාත් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසි අංක 2.9.1 ප්‍රකාරව, එම ගිවිසුම 2016 අගෝස්තු 22 දින සිට බලපැවැත්වෙන පරිදි ව්‍යාපෘතිය මඟින් සමාප්ත කර තිබුණි. මෙම හේතුව නිසා ද්‍රව්‍ය ඉංජිනේරුවරයෙකු, ප්‍රමාණ තක්සේරුකරුවෙකු සහ උපදේශන කටයුතු සඳහා වූ ඉංජිනේරුවන් සිවිල් ඉදිකිරීම් කටයුතු සඳහා ලැබී නොතිබුණි.

(ආ) මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් ඔහුගේ අංක RDA/SPMU/KFAED/KDEB/Vol.3 හා 2016 සැප්තැම්බර් 09 දිනැති ලිපිය මඟින් ව්‍යාපෘතියේ ඉංජිනේරුවරයෙකු ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ලෙස වහාම ක්‍රියාත්මක වන පරිදි පත්කර තිබුණි. මෙම නිසා ව්‍යාපෘතියේ ඉංජිනේරුවරයාට ව්‍යාපෘතිය යටතේ පවරා තිබුණු රාජකාරි වෙන්කර දැක්වීමෙකින් තොරව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ඉටුකර තිබුණි.

(ඇ) පාලම් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ඔවුනගේ මූල්‍ය හා තාක්ෂණික සම්පත් පදනම් කරගෙන තෝරාගෙන තිබුණු අතර විදේශීය සහයෝගීතාවයන් සහිත ආයතන සහ දේශීය හා විදේශීය ආයතන යන දෙවර්ගයම ඉදිකිරීම් කටයුතු හා නඩත්තු කටයුතු සම්බන්ධව සාමූහිකව හා වෙන් වෙන්ව වගකිව යුතු වේ. එසේ වුවත්, කොන්ත්‍රාත් පැකේජ - 01 යටතේ වන ඉදිකිරීම් කටයුතු සඳහා විදේශීය හවුල්කරුවන් සහභාගී නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. අංක RDA/SPMU/KFAED/Gen/Vol.04 හා 2017 ඔක්තෝබර් 06 දිනැති ලිපියට අනුව, වැඩ නිම කිරීමට අපොහොසත් වීම සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් නීතිමය පියවර ගන්නා බව දක්වා තිබුණි.

(ඈ) පාලම් ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.මිලියන 98.71 ක් 2015 නොවැම්බර් හා 2016 ජූලි යන මාසවල දෙවරකදී ව්‍යාපෘතිය මඟින් ගෙවා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම්වල ප්‍රතිපාදනවලට අනුව කළ වැඩ වටිනාකම සියයට 30 ක ප්‍රමාණයට ළඟා වූ විට වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. එසේවුවත්, පැකේජ-01 යටතේ වන කොන්ත්‍රාත්වලින් අයකර ගැනීමේ කටයුතු 2016 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

**3.4 මතභේදයට තුඩුදුන් කරුණු**

අංක 1/1 කඩුවෙල-බියගම මාර්ගයෙහි පිහිටි පාලමෙහි ප්‍රමාණ පත්‍රිකාවල සඳහන් විස්තරවලට අනුව, කොන්ත්‍රාත් වැඩබිමේ අංගනයක් (Cofferdam) ඉදිකිරීම සඳහා රු.මිලියන 5 ක් ප්‍රතිපාදනය කර තිබුණි. එසේ වුවත් රු.මිලියන 24.43 ක පිරිවැයකට අංගනයක් ඉදිකරනු වෙනුවට, අදාල අනුමැතීන් ලබා ගැනීමෙන් තොරව තාවකාලික ජැටියක් කොන්ත්‍රාත්කරු විසින් ඉදිකර තිබුණි.

**3.5 මානව සම්පත් කළමනාකරණය හා සම්බන්ධිත ගැටළු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර තිබුණු 2016 ඔක්තෝබර් 20 දිනැති ලිපිය ප්‍රකාරව පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ඉල්ලා තිබුණද, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන ඉංජිනේරුවන් 03 දෙනෙකු, ව්‍යාපෘති ඉංජිනේරුවන් 06 දෙනෙකු හා කාර්මික නිලධාරීන් 09 දෙනෙකු වශයෙන් ප්‍රධාන තනතුරු වර්ෂ 02 කට වැඩි කාලයක සිට 2016 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව, ව්‍යාපෘතිය විසින් 2015 දෙසැම්බර් සහ 2016 ජනවාරි මාසවලදී උපදේශකවරුන් තිදෙනෙකු සහ මහජන සම්බන්ධතා නිලධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර ඔවුන්ගේ දීමනා ලෙස එකතුව රු.මිලියන 1.61 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණි.